පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව- සතිපාසල

සතිය - 10

විෂය:- පෙරදිග සංගීතය

ශ්‍රේණිය :- 11

Prepared by - කලාප අධ්‍යාපන කාර්යාලය, කෑගල්ල

# සබරගමු වන්නම්.

- රත්නපුර,කලවාන,කුරුවිට,පැල්මඩුල්ල,නිවිතිගල,හිදැල්ලෙන, බලංගොඩ ආදී සබරගමු පළාතට ආවේනික නැටුම් සම්ප්‍රදායකි.
- දෙවියන් හා සතුන් ගැන ඇතුලත් ගීත විශේෂයකි .
- සමන් දේවාල පෙරහැර දෙවියන් උදෙසා සබරගමු වන්නම් නර්තනය කලබව පොත පතෙහි සඳහන්ය.



- සබරගමු වන්නම් කිහිපයක් -
  - ගාහක
  - උරගා
  - මයුරා
  - තිසරා
  - කෝකිල
  - ආනන්ද
  - අනිලා
  - මණ්ඩුක
  - කදම්බ පක්ෂි
  - විරාඩි
- දෙශීය තිත් ක්‍රමය මත ගොඩ නැගී අතර සබරගමු වන්නම් වල ස්වර ක්ෂේත්‍රය පටුය.

- ගී තනු මිහිරිය ,ලයාන්විත බවින් ඉහලය.
- ප්‍රධාන තාල වාද්‍ය භාණ්ඩය දවුල වේ.
- විනෝදාස්වාදයක් ගෙන දේ.
- නාමිකව වන්නම් 24ක් හා භාවිතයේ වන්නම් 18ක් ඇත.



- ***පහත වගුව අධ්‍යයනය කරන්න.***

| සබරගමු නර්තන සම්ප්‍රදාය | | | | |
|---|---|---|---|---|
| වාද්‍ය භාණ්ඩය | වන්නම් | ශාන්තිකර්ම | නිර්මාණකරු | වන්නමක කොටස් |
| දවුල | තිසරා | පහන්මඩු | කලවානේ ධර්මාලංකාර අතපත්තු මුදලිතුමා | දවුල් පදය |
| | | | | තානම |
| | | | | කවිය |
| | | | | කලාසම |
| | කෝකිල | ගම්මඩු | | අඩව්ව |

- ***කෝකිල වන්නම***
  - තාලරූප දෙකකින් ගැයේ.
  - මැදුම් තනි තිත හා දෙසුලු මැදුම් තුන් තිත අනුවය.

- **තානම-**

තාන තනා තන තනෙනා- තෙතන තනා තන තනෙනා
තාන තනා තම්දෙනා -තනෙන තම් තෙතනතනා තම්දෙනා

- **කවිය-**

කොහොවී යානා හඬ නගනා මියුරු වනා දන සවනා
පරපුටු වෙසෙසින්නේ වසන්නේ -මහවන ගස් මුදුනේ

රිටුවමිනා බිජු ලමිනා -බහු නදනා රැකෙනා මෙනා
ලොකුවී නද දෙන්නේ -ඔවුන්ගේ එම විට බැට කන්නේ

රුව සමනා උවත් මනා-ඉසි වඩනා රිටු නොමිනා
රිටු පරපුටු හටනේ -දෙවන්නේ නිදසුන් යස රුවිනේ

ලොව දුර්ජනා ගතිය මනා -මෙම හට නාලොව තිබෙනා
අසනුය වියතුන්නේ ගයන්නේ මේ මනහර වරුනේ



- පැවරුම....

1) සබරගමු වන්නම් පළිබඳ නිර්වචනයක් ලියන්න.
2) සබරගමු වන්නම රචනා කර ඇත්තේ කවුරුන් විසින්ද ?
3) සබරගමු වන්නමේ කොටස් ලියන්න.
4) වාදනය කරනු ලබන ප්‍රධාන අවනද්ද භාණ්ඩය කුමක්ද?
5) නාමිකව හා භාවිතයේ යෙදෙන වන්නම් ගණන කොපමණද?

